විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

# ප්‍රසම්පාදන දැන්වීමයි

## විදේශ රැකියා අපේක්ෂිතයින් පුහුණු කරනු ලබන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පුහුණු මධ්‍යස්ථාන සඳහා පිසූ ආහාර සැපයීම

**PR/02/01-03(2)**

1. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ (SLBFE) පුහුණු මධ්‍යස්ථානයන්හි පුහුණුව ලබන අභ්‍යාසලාභීන් වෙනුවෙන් වසරක කාලයක් සඳහා දිනපතා සකස් කළ ආහාර සැපයීම සඳහා මුද්‍ර, තැබූ ලංසු මෙයින් කැඳවනු ලැබේ. ආහාර සැපයිය යුතු කාර්යාංශ පුහුණු මධ්‍යස්ථාන ලිපිනයන් පහත වගුවේ දක්වා ඇත.

| අනු අංකය | පුහුණු මධ්‍යස්ථානය | ලිපිනය | දුරකථන අංක |
|---|---|---|---|
| 01 | බස්නාහිර පළාත් විගමනික සම්පත් මධ්‍යස්ථානය - මතුගම | බණ්ඩාරනායක මාවත, මතුගම වත්ත, මතුගම | 034-2247323<br>034-3021566 |
| 02 | වැහැර පුහුණු මධ්‍යස්ථානය | අංක 208 A, කොළඹ පාර, වැහැර, කුරුණෑගල | 037-2054373<br>037-2232640 |
| 03 | දඹුල්ල පුහුණු මධ්‍යස්ථානය | අංක 03, නිශ්ශංක මාවත, දඹුල්ල | 066-2284074 |
| 04 | පන්නිපිටිය පුහුණු මධ්‍යස්ථානය | අංක 241/1, පරණ පාර, පන්නිපිටිය | 011-2846904 |

2. ලංසුකරුවන් තම සමාගමේ ලිපි ශීර්ෂය මගින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් ආපසු නොගෙවනු ලබන රු.5,000/- ක තැන්පතු මුදලක් කාර්යාංශයේ මුදල් අයකැමි වෙත මුදලින් ගෙවා 2026.10.05 දින සිට 2026.10.22 දින දක්වා කාර්යාල දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව 3.00 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ, ප්‍රසම්පාදන අංශය වෙතින් ලංසු ලේඛන ලබා ගත හැකි අතර, ගාස්තුවකින් තොරව අදාළ ලංසු ලියවිලි පරීක්ෂා කිරීම කාර්යාංශයේ ප්‍රසම්පාදන අංශයෙන් රාජකාරී වේලාවන් තුළ දී සිදු කළ හැක.

3. එක් එක් මධ්‍යස්ථානය සඳහා වෙන වෙනම ලංසු ඉදිරිපත් කළ යුතු අතර, ඒ සඳහා වෙන වෙනම ලංසු සුරක්ෂණය (Bid Security) ද ලබා දිය යුතුය. ලංසුපත් බහාලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"පුහුණු ලාභීන් සඳහා සකස් කළ ආහාර සැපයීම සඳහා වන මිල ගණන් කැඳවීම - PR/02/01-03(02)"** යනුවෙන් සටහන් කළ යුතුය. ලංසුපත් පහත සඳහන් ලිපිනයේ පිහිටා ඇති ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයෙහි, දෙවන මහලේ ප්‍රසම්පාදන අංශයේ, ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටි (අංක 01) බහාලිය යුතුය.

4. ලංසුපත් භාර ගැනීම 2026.10.23 දින පෙ.ව 10.00 ට අවසන් වන අතර, එම කාර්යය අවසන් වූ වහාම ලංසුපත් විවෘත කරනු ලැබේ. ලංසුපත් විවෘත කරන අවස්ථාවට සහභාගී වීම සඳහා ලංසුකරුට හෝ බලයලත් නියෝජිතයකුට අවසර දෙනු ලැබේ.

5. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධ අවසාන තීරණය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතු වේ .

**සභාපති,**
**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,**
**අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත කොස්වත්ත, බත්තරමුල්ල.**
**දුරකථන / ෆැක්ස් 011-2880550/ 2880564/ 2887585**
**Email : mgr_procurement@slbfe.lk.lk**